පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **07**

# දෙවන වාර පරීක්ෂණය - 2019

විෂයය **බුද්ධ ධර්මය**

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ..................................................
..................................................

කාලය : පැය **02** යි.

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදු රජාණන් වහන්සේගේ අනිමිසලෝචන පූජාව තුළින් ප්‍රකට වන ගුණය වන්නේ,
(1) ඉවසීමේ ගුණය යි.
(2) කළගුණ සැලකීමේ ගුණය යි.
(3) තාදි ගුණය යි.

02. උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
(1) රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීම යි.
(2) මළ මූත්‍රා ආදිය කෙරෙහි පිළිකුල් නූපදවීම යි.
(3) රෝගියාගේ සිත සැනසෙන පරිදි කතා නොකිරීම යි.

03. මිගාර මාතා නමින් ප්‍රසිද්ධියට පත් වූයේ,
(1) විශාඛා සිටු දේවිය යි.
(2) සුජාතා සිටු දේවිය යි.
(3) කිසාගෝතමී දේවිය යි.

04. බුදු රජාණන් වහන්සේගේ 'පුරිසධම්ම සාරථී' බුදු ගුණයෙන් දමනය කළ පුද්ගලයෙකු නොවන්නේ,
(1) අංගුලිමාල ය.
(2) සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ය.
(3) ආලවක යක්ෂයා ය.

05. සිරිත් ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) කළ යුතු දේ කිරීම යි.
(2) නොකළ යුතු දේ කිරීම යි.
(3) කළ යුතු දේ නොකර සිටීම යි.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

**(වැරදි, සිගාලෝවාද, අපණ්ණක, අටසිල්, යමක)**

06. ගුරු සිසු යුතුකම් ............................................ සූත්‍රයේ දැක්වේ.
07. 'අක්කොච්ඡි මං අවධි මං' යන ගාථාව ධම්ම පදයේ ........................ වග්ගයට අයත් වේ.
08. 'නිති පන්සිල්, පොහොය ..................................' යනුවෙන් කියමනක් වේ.
09. වචනයෙන් සිදුවන ............................................. හතරකි.
10. ඉවසිලිමත් බව හා විමසිලිමත් බව ............................. ජාතකයෙන් පිළිබිඹු වේ.

- **අංක 11 සිට 15 දක්වා ඇති වාක්‍යාංශවලට ගැළපෙන පිළිතුර තෝරා වරහන් තුළ පිළිතුරට අදාළ අංකය ලියන්න.**

| | | |
|---|---|---|
| 11. බුද්ධ කාරක ධර්ම | (.............) | 1. නවයකි |
| 12. දැහැමි රැකියාවකි | (.............) | 2. දස පාරමිතා |
| 13. ගිලානෝපස්ථානය | (.............) | 3. දෙව්රම් වෙහෙර |
| 14. ආනන්ද බෝධිය | (.............) | 4. කෘෂි කර්මාන්තය |
| 15. බුදු ගුණ | (.............) | 5. පූතිගත්ත තිස්ස හිමි |

- **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16. ඉවසීමේ ප්‍රධාන ආනිශංස පහකි. (.............)
17. සාලිකේදාර ජාතකයෙන් මව්පියන්ට සැලකූ කුරුලු පැටවකුගේ කතාව ඉදිරිපත් කෙරේ. (.............)
18. දුටුගැමුණු කුමරු හා සද්ධාතිස්ස කුමරු අතර ගැටුම් ඇති වී නොමැත. (.............)
19. සමහර පුද්ගලයින් ජාතිය, ආගම, කුලය වෙනුවෙන් විරසක වෙති. (.............)
20. හොඳින් ඉගෙනීම ගුරුවරයාගෙන් සිසුවාට වන යුතුකමකි. (.............) (ලකුණු 2×20=40)

Education NCP - www.edncp.lk

# II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. වෙසක් සතිය නිමිත්තෙන් පාසලට ආසන්නයේ ම පවතින විහාරස්ථානය පවිත්‍ර කිරීමට ඔබ ශ්‍රේණියේ සිසු දරු දැරියන්ට පැවරුණේ යැයි සිතා පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

i. විහාරස්ථානය පවිත්‍ර කිරීමට යාමේදී ඔබට කළ හැකි කාර්යයන් **දෙකක්** ලියන්න. (ලකුණු 04)
ii. විහාරස්ථානයේ ඔබට පවිත්‍ර කළ හැකි ස්ථාන **හතරක්** නම් කරන්න. (ලකුණු 04)
iii. සාමූහිකව ක්‍රියාත්මක කළ හැකි මෙම වැඩසටහනේදී ඔබ ලබන අත්දැකීම් **හතරක්** ලියන්න. (ලකුණු 04)
iv. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඔබට මුහුණ දීමට සිදුවන අභියෝග **දෙකක්** ලියන්න. (ලකුණු 04)
v. වෙසක් සතිය නිමිත්තෙන් පාසලේ සංවිධානය කළ හැකි වෙනත් වැඩසටහන් **හතරක්** ලියන්න. (ලකුණු 04)

02.
i. මිනිසාත්, තිරිසන් සත්ත්වයාත් අතර පවතින වෙනස් ගති ලක්‍ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02)
ii. ආජීව අෂ්ටමක ශීලයේ සඳහන් සිල් පද **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)
iii. ආජීව අෂ්ටමක ශීලය ආරක්ෂා කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **පහක්** ලියන්න. (ලකුණු 05)

03.
i. වැඩිහිටියන් ලෙස හැඳින්වෙන කණ්ඩායම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
ii. අග්‍රශෲ්‍ය දානය පිළියෙල කිරීමේදී හා පිළිගැන්වීමේ දී සැලකිළිමත් විය යුතු කරුණු **තුනක්** ලියන්න. (ලකුණු 03)
iii. ගිහියන්ට භික්ෂූන් වහන්සේලාගෙන් සිදුවන කාර්යය භාරයන් **පහක්** නම් කරන්න. (ලකුණු 05)

04.
i. 'පින්මඟ පුතුන් සියයක් ලදුවත් නිසරු' යන කවියට අනුව 'පින්මඟ පුතුන් ' යන වදනින් අර්ථවත් වන්නේ කුමක් ද ? (ලකුණු 02)
ii. 'පින්මඟ පුතුන් සියයක් ලදුවත් නිසරු' යන කවිය නිවැරදිව ලියන්න. (ලකුණු 03)
iii. පින්වත් දරුවෙකුගේ ලක්‍ෂණ **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05)

05.
i. පංච ශීල ප්‍රතිපදාවට අනුව හැසිරීම හා වැළකීම හඳුන්වන තවත් නම් **දෙකක්** ලියන්න. (ලකුණු 02)
ii. යහපතෙහි යෙදීමේ අංග **තුන** සඳහන් කරන්න. (ලකුණු 03)
iii. මුසාවාදයෙන් වැළකීමේ ආනිශංස **පහක්** ලියන්න. (ලකුණු 05)

06.
i. අපණ්ණක ජාතකයට අනුව, බෝසතාණෝ ඇතුලු පිරිස වෙළඳාම පිණිස පසුව යාමෙන් ලැබුණු ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02)
ii. කාන්තාරයේදී වෙළෙඳුන්ට යක්ෂයා මවා පෙන්වූ දර්ශන **තුනක්** ලියන්න. (ලකුණු 03)
iii. අපණ්ණක ජාතකයෙන් පිළිබිඹු වන නායකත්ව ලක්ෂණ **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05)

07.
i. භාවනාව සඳහා සුනාපරන්තයට වැඩම කළ ස්වාමීන් වහන්සේගේ නම සඳහන් කරන්න. (ලකුණු 02)
ii. එම ස්වාමීන් වහන්සේගේ ඉවසීම පරීක්ෂා කිරීමට බුදුරජාණන් වහන්සේ විසින් විමසන ලද ප්‍රශ්න **තුනක්** ලියන්න. (ලකුණු 03)
iii. ඔබේ හොඳම මිතුරෙකු විභාගයෙන් අසමත් වූයේ යැයි සිතා, ඔහුගේ සිත සැනසීමට ඔබ ක්‍රියාකරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

* * *

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440